**සීමාසහිත හලාවත වැවිලි සමාගම - 2017**

**----------------------------------------------------**

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**----------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------------**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් අයවිය යුතු වටිනාකම පිළිවෙලින් රු.47,627,397 ක් හා රු.23,610,959 ක් ලෙස සඳහන් වුවද, අදාල ආයතන විසින් 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල ශේෂ සනාථන ලිපි අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.63,672,397 ක් හා රු.31,610,959 ක් විය.

(ආ) සමාගම සතු කල්බදු වටිනාකම රු.142,502,287 ක් වූ හෙක්ටයාර් 5,733 ක ඉඩම් වලට අදාල පිඹුරුපත් සමාගම සතුව නොතිබුණි.

(ඇ) සමාගම විසින් සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව හා රාජ්‍ය සම්පත් හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයට 2010 වර්ෂයේදී ලබා දුන් කෙටිකාලීන ණය මුදල් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වටිනාකම පිළිවෙලින් රු.10,000,000 ක් හා රු.15,000,000 ක ශේෂ, තහවුරු කර ගැනීමට අදාල ශේෂ සනාථන ලිපි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත හලාවත වැවිලි සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

--------------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මඟින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මා දරන්නාවූ මතය

- විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ගොස් ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

----------------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) 7 වන පරිච්ඡේදයෙහි 3.1 ඡේදය | 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය තෙක් බඳවා ගන්නා ලද නිලධාරීන් 6 දෙනෙකු පත්කිරීමේදී එම තනතුරුවලට අදාල ආරම්භක වැටුප් පියවරට වඩා වැඩි වැටුපක පිහිටුවීම හේතුවෙන් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.3,032,873 ක අමතර වැටුප් ගෙවා තිබුණි. |
| (ii) Vවැනි පරිච්ඡේදයේ 7 වන ඡේදය | නිවාඩු ලබා නොගෙන රාජකාරියට නොපැමිණෙන නිළධාරියෙකු අදාල දින සිට සිය තනතුර අත්හැර ගියාසේ සලකා සේවයෙන් ඉවත් කළ යුතු වුවත් සහකාර වතු අධිකාරීවරයකු 2016 නොවැම්බර් 28 දින සිට දැනුම් දීමකින් තොරව සේවයට වාර්තා කර නොතිබුණද, එම නිළධාරීයා වෙත සේවය අතහැරයාමේ ලිපියක් නිකුත් කර සේවයෙන් ඉවත් කිරීමට මෙම වාර්තාව නිකුත් කරන දින වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | අනුමත වැටුප් හා දීමනා වල ඇතුලත් නොවන වැටුප් හා දීමනා ගෙවීමට පෙර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් අවසර ලබා ගැනීමකින් තොරව සහකාර වතු අධිකාරීන් හා වතු අධිකාරීන් නොවන කණිෂ්ඨ මට්ටමේ සිට ප්‍රධාන විධායක නිලධාරිවරයා දක්වා නිලධාරීන් 21 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.6,940,955 ක මුදලක් "කම්කරු දීමනා" ලෙස ගෙවා තිබුණි. |
| (ඇ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) සභාපතිවරයා විසින් චක්‍රලේඛයට අනුව අනුමත ඉන්ධන සීමාව ඉක්මවා ඉන්ධන ලබාගන්නා සෑම අවස්ථාවකදීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව අමාත්‍යාංශ ලේකම් වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ නොමැතිව අනුමත සීමාව ඉක්මවා ලබාගත් ඉන්ධන ලීටර් 3,082 ක් සඳහා රු. 340,912 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි.<br><br>(ii) ඉන්ධන දිමනා හිමිකම් නොමැති නිලධාරීන් 05 දෙනෙක් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.135,224 ක වටිනාකමකින් යුත් ඉන්ධන ලීටර් 1,156 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.81,446,237 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.69,672,008 ක් වීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,774,229 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීමේ ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව රු.15,332,458 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනයවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේ රු.62,071,904 ක අලාභයක් පෙන්නුම් කළ අතර, අනෙතුත් වර්ෂයන්හි ලාභය 2012 වර්ෂයට සාපේක්ෂව ක්‍රමයෙන් අඩු වී පැවතුණි. සේවක පාරිශ්‍රමික 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ලාභය අඩු වුවද ආදායම් බදු වගකීම 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.5,534,003 කින් වැඩිවී තිබුණි. සමාගමේ දායකත්වය ක්‍රමයෙන් වැඩි වී තිබූ අතර 2014 වර්ෂයේදී අවම දායකත්වය රු.131,080,449 ක් ලෙස වාර්තා වූ අතර 2016 වර්ෂයේදී දායකත්වය රු.304,554,146 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සමාගමේ ඇස්තමේන්තු ගත පොල් ඵලදාවට වඩා සත්‍ය පොල් ඵලදාව සියයට 32 කින් ද, පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඵලදාව සියයට 29 කින්ද පහළ ගොස් පැවතියද, සමාගමේ විකුණුම් පිරිවැය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 33 කින් ඉහල ගොස් තිබුණි. පරිනත වගාව තුල පවතින වගාවෙන් සියයට 28 ක් වර්ෂ 50 ඉක්මවූ වගාවන්වීම හා නියඟයට මුහුණ දීමට අවශ්‍ය උපයා මාර්ග (පොල් ලෙලි වල දැමීම) අනුගමනය නොකිරීම ඵලදාව අඩුවීමට හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) පොල් පර්යේෂණ ආයතනයේ සම්මතයන්ට අනුව ප්‍රමිතියෙන් යුතුව වගාකරන ලද පොල් ගසක වාර්ෂික සාමාන්‍ය ඵලදාව පොල් ගෙඩි 72 ක් පමණ විය යුතු වුවත් සමාගම විසින් පාලනය කරන වතු 06 ක මෙම අගය 29-67අතර පරාසයක පැවතුණි.

(ඇ) සමාගමේ මුළු ඵල දරන පොල් ගස් ප්‍රමාණයෙන් සියයට 1-8 ත්අතර ප්‍රමාණයක් උස ගස් පවතින අතර, වැටුණු පොල් ප්‍රතිශතය අවම කර ගැනීම සඳහා මාසික පොල් අස්වනු නෙලීමට කළමණාකරණය තීරණය කර තිබුණද මුළු පොල් ඵලදාවෙන් සියයට 30 ක් එනම් පොල් ගෙඩි 3,906,827 ක් පමණ වැටුණු පොල් විය. ඒ අනුව වතු 06 ක පැවති උස ගස් ප්‍රමාණය හා වැටුණු පොල් ප්‍රතිශතය සැසඳීමේදී එක් ගසකින් වැටුණු පොල් ප්‍රමාණය ගෙඩි 66-95ත් අතර පරාසයක පැවතුණි. ඒ අනුව එය අදාල වතුයායන්හි ගසකින් ලැබෙන සත්‍ය පොල් ඵලදාවට වඩා උස ගසකින් ලැබෙන ඵලදාව වැඩි බව නිරීක්ෂණය විය.

(ඈ) ක්ෂේත්‍රයේ පවතින සම්මතයන්ට අනුව, ඉඩම් හෙක්ටයාරයක පැවතිය යුතු පොල්ගස් ප්‍රමාණය 158 ක් වුවද, සමාගමේ දිවුලපිටිය වතුයාය හැර ඉතිරි වතුයායන්හි එම අගය 112-

147 අතර පරාසයක පැවතුණි. ඒ අනුව සමාගමේ වතුයායන්හි පැවතිය යුතු ගස් ප්‍රමාණයට වඩා අඩු ගස් ප්‍රමාණයක් පවත්වාගෙන යාම පොල් ඵලදාව අඩු වීමට හේතු වී තිබුණි.

(ඉ) සමාගම පාලනය කරන වතු 06 හි පරිණත වගාවන් යටතේ හඳුනාගනු ලැබූ ඵලදැරිය යුතු කාලය සම්පූර්ණ වූ පොල් ගස් 108,307 ක් ඵල දරන තත්ත්වයට පත්වී නොමැති බව නිරීක්ෂණය විය. ගසකින් ලබා ගත යුතු සම්මත ඵලදාව අනුව අදාල ගස් ප්‍රමාණයෙන් වාර්ෂිකව ලබාගත හැකි පොල් ගෙඩි 7,798,104 ක පමණ ඵලදාවක් ලබා ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි .

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තම්බපන්නි වතුයායට අයත් ජසින්තා බෙදුමෙහි 2011 වර්ෂයේ සිදු වී තිබූ පොල් ගෙඩි 3380 ක සොරකමට අදාල නඩුව අවසන් වී වසර 4 කට අධික කාලයක් ගතවී තිබුණද, මෙම සොරකම නිසා සිදු වූ මූල්‍යමය පාඩුව වූ රු.105,175 ක වටිනාකම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් අයකර ගැනීමට හැකියාව තිබියදී සමාගම අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදී තෙල් සිදීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.4,850,126 ක මුදලක් පෞද්ගලික සමාගමක් වෙත ගෙවීමට ගිවිසුම් ගත වී තිබුණද, අදාල ව්‍යාපෘතිය ආරම්භ කර වසර 05ක් ඉක්මවා තිබූ නමුත් ගිවිසුම් ගත පරිදි නිෂ්පාදන ධාරිතාවය ලබා ගැනීමට හැකිවන පරිදි යන්ත්‍රය ස්ථාපිත කිරීමට අදාල පෞද්ගලික සමාගම අපොහොසත් වී තිබුණි. ඒ අනුව අදාල ගිවිසුම අවලංගු කර සිදු වූ අලාභය අයකර ගැනීමට හෝ වෙනත් සැපයුම්කරුවකු මඟින් අදාල කාර්යය නිමකරවා ගැනීමට සමාගම කටයුතුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට පළුගස්වැව වතුයායේ පිහිටි මයිටා පර්යේෂණාගාරය තුල 2017 වර්ෂයේදී නිෂ්පාදිත මයිටා විලෝපිත බෑග් 10,500 කට ආසන්න ප්‍රමාණයක් මයිටා හානියට ලක් වූ ක්ෂේත්‍රයන්ට යෙදීමට සමාගම කටයුතු කර නොතිබීම හේතුවෙන් 2018 අගෝස්තු 10 දින වන විටත් කල් ඉකුත්වී පැවතිණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොල් පර්යේෂණ ආයතනයේ දත්තයන්ට අනුව මයිටා වැලඳුනු වගාවන් සඳහා සෑම ගස් 4 කටම එක් ගසකට මයිටා විලෝපිත බෑග් වර්ෂ 2ක කාලයක් පුරා සෑම මාස 2ත් 3ත් අතර කාලයකට වරක් දැමීම මඟින් මෙම රෝගය පාලනය කළ හැකි බව දක්වා තිබුණද, මයිටා විලෝපීයන් එක් වරක් නිකුත්කර තිබූ පළුගස්වැව වතුයායෙහි ක්ෂේත්‍ර 04 න් ක්ෂේත්‍ර 02 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී නැවත මයිටා විලෝපිකයින් නිකුත්කර නොතිබූ අතර ඉතිරි ක්ෂේත්‍ර 02 සඳහා දෙවන නිකුත්කිරීම පමණක් නිකුත්කර තිබූ අතර එම නිකුතුව සඳහාද මාස 04 කට වැඩි කාලයක් ගතවී තිබුණි. නියමිත පරිදි මයිටා විලෝපික නොයෙදීම හේතුවෙන් රෝගය වලක්වාගත නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සමාගමේ වතුයායන් 6 හි පොල් පැල 139,682 ක් සිටුවා තිබුණද, වගාවන් සඳහා ප්‍රමාණවත් පොහොර භාවිතය, වල් නෙලීම හා ජල සැපයුම් යනාදී කාර්යයන් සැලසුම් කල පරිදි ඉටු නොකිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට පැල 35,555 ක් එනම් සියයට 25 ක් විනාශ වී පැවතුණි.

(ඇ) දිවුලපිටිය වතුයාය සතුව හෙක්ටයාර් 68.33 ක කුඹුරු ඉඩම් පැවතියද, ඉන් හෙක්ටයාර් 64.62 ක භූමියක් වර්තමානය වන විට අඳගොවීන් අත්පත් කර ගෙන තිබූ අතර, මෙම ඉඩම් නැවත

සමාගමේ පරිපාලනයට ලබාගැනිමට කළමණාකරණය විසින් කටයුතුකර නොතිබුණි. තවද, ඉතිරි හෙක්ටයාර් 3.71 ක කුඹුරු ඉඩම් ප්‍රමාණය ඵලදායී අරමුණකට යොදා ගැනීමට හෝ බදුදීමට කටයුතු කර නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු නාම 11 ක් යටතේ පුරප්පාඩු 23 ක් ද තනතුරු නාම දෙකක් යටතේ අතිරික්ත සේවකයින් 05 දෙනෙකු පැවති අතර ඒ තුල අභ්‍යන්තර විගණක, සහකාර විගණක තනතුරු 02 ක් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී යන තනතුරු ඇතුලත් වී තිබුණි.

(ආ) සමාගම විසින් 2017 ජුලි 25 දින රු.173,000 ක වියදමකින් ප්‍රසිද්ධ පුවත් දැන්වීමක් මගින් විගණන සහකාර හා කළමණාකරණ සහකාර තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවා තිබු නමුත් එම බඳවා ගැනීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබූ අතර 2018 ජුනි මාසයේදී ප්‍රධාන කාර්යාලයේ හා වතු කාර්ය මණ්ඩලයේ පුහුණු නිළධාරීන් ලෙස සේවය කල සේවකයින් 13 දෙනෙකු ස්ථිර සේවකයින් ලෙස වතු කාර්යය මණ්ඩලයට පත්කර එයින් සේවකයින් 06 දෙනෙකු ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර තිබුණි.

(ඇ) වැටුප් හා සේවක කොමිෂන් සභාවේ හා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත කාර්යය මණ්ඩලය තුල නොමැති සහකාර සාමාන්‍යාධිකාරි,ඉංජිනේරු , ප්‍රධාන අභ්‍යන්තර විගණක යන තනතුරු දෙකද ඇතුලත්ව අනුමත කාර්යය මණ්ඩලය තුල නොමැති තනතුරු 10ක් සඳහා නිලධාරීන් බඳවාගෙන තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

-------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අයවැය පාලනය | අයවැය මගින් ඉලක්ක ස්ථාපිත කර තිබුණද ඒවා සපුරාගැනීමේ ක්‍රියාවලිය දුර්වල මට්ටමක පැවතීම. |
| (ආ) ණයගැති හා ණයහිමි පාලනය | දිගුකාලීන ණය ශේෂ නිරවුල් කිරීමට හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | තරුණ කම්කරුවන් අළුතින් සේවයට එක් නොවීම හේතුවෙන් දැනට සිටි සේවකයින් වැඩි ප්‍රමාණයක් අවුරුදු 50 ට වැඩි වයසේ පසුවන අතර අනාගතයේදී නව කම්කරුවන් බඳවා ගැනීමේ අවධානමක් පැවතීම. |
| (ඈ) වැවිලි කළමණාකරණය | පොල් ගසකින් ලැබෙන අස්වැන්න අඩුවීම, නැවත පොල් වගාකිරීමේ සැලසුම් ක්‍රියාත්මක නොවීම, විද්‍යාත්මක පදනමකින් පොල් පොහොර නොයෙදීම සහ නිසි නඩත්තු හා පාලන ක්‍රම අනුගමනය නොකිරීම හා ප්‍රමාණවත් ජල සැපයුම් පද්ධතියක් නොතිබීම හේතුවෙන් වගා කළ පැල විනාශ වී යැම. |